ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජුනි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 සැප්තැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොටුපළ, පුරවැසි, වීසා හා ගමන් බලපත්‍ර අංශවලට අදාළව මුදල් පොත හා පරිගණක පද්ධතිය අනුව ආදායම සැසඳීමේ දී, ආදායමෙහි වෙනස රු.116,501,586ක් වූ අතර, විදේශ දූතමණ්ඩල අංශයේ අප්‍රේල්, මැයි, ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් යන මාසයන් සඳහා පරිගණක පද්ධතිය අනුව ආදායම සටහන් වී නොතිබූ බැවින්, විගණනයේ දී සමස්ත ආදායමෙහි වෙනස ගණනය කිරීමක් සිදුකළ නොහැකි විය. එසේ යාවත්කාලීන හා නිවැරදි තොරතුරු ලබාගත නොහැකි පරිගණක පද්ධති වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් වසර 22ක කාලයක් පුරා පැරණි ගිවිසුම් අලුත් කරමින් ගෙවීම් සිදුකර තිබුණි.	මුදල් පොත හා පරිගණක පද්ධතිය අනුව සැසඳීමේ දී වෙනස්කම් සඳහා හේතූන් ලෙස ගුවන් තොටුපළේ සේද මාවත හා රන් මාවත භාවිතා කිරීමේ දී මගීන් නිෂ්කාශන කටයුතු වෙනුවෙන් Airport & Aviation Sri Lanka (Pvt) Ltd ආයතනය විසින් දෙපාර්තමේන්තුවට චෙක්පත්වලින් එවනු ලබන ආදායම මුදල් පොතට බැරකර පරිගණක පද්ධතියට ඇතුළත් නොකිරීම, ඇමෙරිකානු ඩොලර් ලෙස අයකර ඇති මුදල්, මුදල් පොතෙහි රුපියල්වලින් සටහන්කර ඇති බවත්, එම ආදායම් පරිගණක පද්ධතියට ඩොලර් යටතේ ඇතුළත්කර තිබීම සමහර අවස්ථාවල දී පරිගණක පද්ධතියේ දෝෂ ඇතිවීම, විද්‍යුත් ගෙවීම් ද්වාර හා කාඩ්පත්වලින් අයකිරීම්වලට අදාළ වාර්තා සහ අයකළ මුදල් (රුපියල්) දෙපාර්තමේන්තු ගිණුමට ලැබෙනුයේ අයකළ දිනට පසුව එළැඹෙන පළමු වැඩකරන දිනක දී බැවින්, එම ආදායම් මුදල් පොතෙහි සටහන්කර ඇත්තේ මුදල් අයකර ඇති දිනට පසුදිනක දී වීම ආදිය	මුදල් පොතෙහි සටහන් ආදායම හා පරිගණක පද්ධතිය අනුව ආදායම සැසඳීම්කර නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතු වේ.

		හේතු ලෙස ලෙස දක්වා තිබුණි. තව ද, ඉදිරියේ දී ගනුදෙනු සිදු වූ දිනය යටතේම එම ආදායම් මුදල් පොතට ඇතුළත් කිරීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි.	

(ආ) තැන්පතු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	පොදු තැන්පතු ලෙජරයෙහි තැන්පතු අංක 6000-0-0-16-0-59 කොන්ත්‍රාත් සඳහා වූ රඳවුම් මුදල්වලට අදාළව 2024 මැයි 31 දින තැන්පතු වටිනාකම වන රු.3,775,195ක මුදල වර්ෂ අවසානයට පොදු තැන්පතු ලෙජරයෙහි ගෙවීම් ලෙස සඳහන්කර ඇති නමුත්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන හා සමාලෝචිත වර්ෂ අවසානයට ශේෂ සැසඳුම් ප්‍රකාශයට අනුව එම ගෙවීම සිදුකර නොතිබුණි.	නිරීක්ෂණය හා එකග නොවන බවත්, පොදු තැන්පත් ලෙජරයෙහි තැන්පතු අංක 6000-0-0-16–0-59 කොන්ත්‍රාත් සඳහා වූ රඳවුම් මුදල වන රු.3,775,195ක මුදල ITMIS පද්ධතියට 2024/12/06 දින ඇතුළත්කර තිබුණ ද, මෙම තැන්පතුව ගෙවීම් කිරීමට අක්මුදල් 2024/12/31 දින වන විට නොලැබීම මත 2024/12/31 දින වන විට ගෙවීම් සිදුකර නොමැති බවත් තව ද, එම වවුචරයේ ගෙවීම් සහතිකකර නොමැති බවත්, පොදු තැන්පත් ලෙජරයෙහි උසස් නිලධාරියාගේ කෙටි අත්සන සටහන් වී නොමැති බවත්, එසේම 2024 දෙසැම්බර් ගිණුම් සාරාංශය මගින් ද උක්ත තැන්පතුව ගෙවීම් සිදුකර නොමැති බවත් තව ද, පොදු තැන්පත් ලෙජරයේ ආරම්භක ශේෂයක් ලෙස මෙම වටිනාකම සටහන්කර ඇති බවත් දක්වා තිබුණි.	පොදු තැන්පතු ලෙජරය නිවැරදි ලෙස යාවත්කාලීනකර පවත්වාගත යුතු වේ.
(ii)	පොදු තැන්පතු ලෙජරයෙහි වර්ෂ අවසානයට තැන්පතු අංක 6000-0-0-16-0-59 කොන්ත්‍රාත් සඳහා වූ රඳවුම් මුදල්වලට අදාළ වර්ෂය තුළ හරකිරීම් වටිනාකම රු.4,719,309ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයන්හි (ACA-4) වර්ෂයේ හරකිරීම් වටිනාකම ලෙස රු.1,995,015ක් දක්වා තිබූ අතර, රු.2,724,294ක වෙනසක් පැවතුණි.	පොදු තැන්පත් ලෙජරයෙහි තැන්පතු අංක 6000-0-0-16-0-59 කොන්ත්‍රාත් සඳහා වූ රඳවුම්වලට අදාළ වර්ෂය තුළ හරකිරීම් මුළු වටිනාකම රු.1,995,015 වන බවත්, එම ගෙවීම් නිවැරදිව මාසික ගිණුම් සාරාංශ මගින් වාර්තාකර ඇති බවත්, පොදු තැන්පත් ලෙජරයේ සටහන් කිරීමේ අඩුපාඩු නිවැරදි කරන ලද බවත් දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කර පරීක්ෂාකර ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ දී මූල්‍ය නොවන වත්කම්වලට අදාළ භාණ්ඩාගාර සටහන් (SA-82) අනුව ආරම්භක ශේෂ සැසදීමේදී ගොඩනැගිලි හා ඉදිකිරීම් ආරම්භක ශේෂය රුපියල් මිලියන 2කින් වැඩියෙන් දක්වා තිබුණි.	2023.12.31 ගිණුම් සාරාංශයට ඉදිරිපත් කරන ලද පළමු පරිපූරක ගිණුම් සාරාංශය මගින් නේවාසික නොවන ගොඩනැගිලි (Non Residential Building – 9151) යටතේ ගිණුම්ගත කරන ලද රු.2,000,000ක මුදල 2023.12.31 දිනට ජංගම නොවන වත්කම්වලට අදාළ භාණ්ඩාගාර අවසන් ගිණුම් වාර්තාව අනුව (SA-82) නොදැක්වීම සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත්කර ඇති බවත්, තව ද, 2023 දෙසැම්බර් මස ජංගම නොවන වත්කම් වාර්තාව (SA-81) මගින් ඉහත වත්කම් ගිණුම්ගතකර ඇති බවත් දක්වා තිබුණි.	නිවැරදි වටිනාකම් ගිණුම්ගතකර මූල්‍ය ප්‍රකාශන සකස්කළ යුතු වේ.
(ii)	භාණ්ඩාගාර සටහන (SA-10) අනුව වැය විෂය අංක 226-1-1-0-2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ වෙනත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු විසින් රු.2,268,697ක වියදමක් උක්ත වැය විෂය වෙනුවෙන් වියදම්කර තිබුණ ද, එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ අවසානයට මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA-82) ඇතුළත් කර නොතිබුණි.	ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කටුනායක විවේකාගාරයෙහි හදිසි සහ අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු 226-01-01-2104 යටතේ ඉතිරිව පැවති ප්‍රතිපාදන මගින් සිදුකරන ලද බවත්, මෙය වත්කම් අත්පත්කර ගැනීමක් නොවූ බැවින් හා ප්‍රතිසංස්කරණයක් පමණක් වූ බැවින් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත නොකරන ලද බවත් දක්වා තිබුණි.	නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වේ.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයන් 07ක් සඳහා ප්‍රතිපාදිත රු.611,200,000කින් රු.307,037,600ක් මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයන්ට මාරුකර තිබූ අතර, එය සියයට 21ත් සියයට 77ත් අතර පරාසයක් ගෙන තිබුණි. ඒ අනුව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසිඅධ්‍යානයකින් සිදුකර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයන් සඳහා පෙර වර්ෂයේ පුරෝකථනය කළ නොහැකි අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන මාරුකිරීමේ දී ඉතිරි කිරීම් ලෙස පිළිවෙලින් ලිපිද්‍රව්‍ය මිලගණන් අඩුවීම හා ලිපිද්‍රව්‍ය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම, ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිතා කිරීම, 2024 වර්ෂයේ විදුලිය කප්පාදුවක් සිදුනොවීම හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාලවල විදුලිජනක යන්ත්‍ර සඳහා ඉන්ධන වැයකිරීමේ අවශ්‍යතාවයක් නොවීම, සංග්‍රහ වියදම් පාලනය කිරීම හා දුරකථන භාවිතය පාලනය කිරීම සහ විදෙස් ගමන් බලපත්‍ර නිකුත්කිරීම සීමාකිරීම හේතුවෙන් තැපැල් වියදම් අඩුවීම දක්වා තිබුණි.	වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි අධ්‍යයනයකින් සිදුකළ යුතු වේ.
(ආ)	පුනරාවර්තන වැය විෂයන් 05ක් වෙනුවෙන් ප්‍රතිපාදිත රු.533,297,600ක මුදලින් රු.217,504,611ක් ඉතිරි වී තිබූ අතර, එම ඉතිරිය සියයට 20 සිට සියයට 52 දක්වා පරාසයක් ගෙන තිබුණි.	සුළු නඩත්තු වියදම් අවමවීම, ප්‍රවාහන දීමනා හිමි තනතුරුවල පුරප්පාඩු පැවතීම, ආරක්ෂක සේවා සැපයීම සඳහා නව ගිවිසුමකට එළැඹීමේ දී පැවති මිලට වඩා මිලගණන් අඩුවීම, සේවා ගිවිසුම් අලුත්කිරීම් අවම වීම, සියලු වාහන රක්ෂණය කළ බැවින්	වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි අධ්‍යයනයකින් සිදුකළ යුතු වේ.

		ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරිවීම, SITA ආයතනයට ගෙවිය යුතු මුදල ගෙවීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අතිරේක ප්‍රතිපාදන ලබාදුන්න ද, ගිවිසුම්ගත හිඟ මුදල ගෙවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යුතු ලියකියවිලි සහ අනුමැතියන් ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම, අපේක්ෂිත පරිදි නිලධාරින් දේපළ ණය ලබානොගැනීම හා වාර්ෂිකව ස්ථාන මාරු වී පැමිණි නිලධාරින්ගෙන් සුළු පිරිසක් පමණක් දේපළ ණය ලබාගෙන සිටීම හේතුවෙන් දේපළ ණය පොළී ගෙවීමේ වියදම් අවමවීම ආදිය හේතු ලෙස දක්වා තිබුණි.	
(ඇ)	වැය විෂය අංක 226-1-1-0-1409 සඳහා රු.160,380,000ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් ද රු.113,117,600ක් මු.රෙ. 66 මාරුකිරීම මගින් ද ප්‍රතිපාදන ලබාගෙන තිබූ නමුත්, රු.189,306,512ක් වර්ෂ අවසානයේ දී ඉතිරිව පැවතුණි. ඒ අනුව ඉතිරි මුදල ශුද්ධ ප්‍රතිපාදනයෙහි සියයට 41ක් විය.	වැය විෂය අංක 226-1-0-1409හි රු.189,306,512ක් වර්ෂය අවසානයේ දී ඉතිරිවීමට හේතුන් ලෙස 2024 වර්ෂයේ සේවා ගිවිසුම් අලුත්කිරීම් අවමවීම හේතුවෙන් අපේක්ෂිත වියදම් පැනනොනැගීම, වර්ෂය තුළ මිලගණන් කැඳවා අවම මිලගණන් යටතේ සියලු වාහන රක්ෂණය සිදුකිරීම හා SITA ආයතනයට ගෙවිය යුතු ඇමෙරිකානු ඩොලර් 525,620 හිඟ මුදල ගෙවීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අතිරේක ප්‍රතිපාදන රු.160,380,000ක් ලබාදුන්න ද, 2024.12.31 දින වන විටත් ගිවිසුම්ගත හිඟ මුදල ගෙවීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යුතු ලියකියවිලි සහ අනුමැතියන් ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම යන හේතුන් දක්වා තිබුණි.	වියදම් දරා නොමැතිව වැය විෂයන්වල ප්‍රතිපාදන ඉතිරිව තිබියදී, මු.රෙ 66 යටතේ ද තවදුරටත් ප්‍රතිපාදන මාරු කරගෙන මුදල් අවුරා තබානොගත යුතු වේ.
(ඈ)	ප්‍රාග්ධන වැය විෂයන් 2ක් වෙනුවෙන් රු.300,000,000 බැගින් මුළු ප්‍රතිපාදිත රු.600,000,000ක ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.157,940,084ක් හා රු.148,389,838ක් ඉතිරිව තිබූ අතර,	ප්‍රාග්ධන වැය විෂයන්හි ඉතිරිවීම්වලට බලපෑ හේතුන් ලෙස ඇතැම් ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුනොවීම මත ව්‍යාපෘති කටයුතු ඉදිරියට ගෙන	වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි අධ්‍යයනයකින් සිදුකළ යුතු වේ.

	එම ඉතිරිය පිළිවෙලින් සියයට 53ක් හා 49ක් විය.	යා නොහැකිවීම සහ ඇතැම් ව්‍යාපෘතිවලට අදාළව මූලික පිරිවිතර සකස්කිරීමට නොහැකිවීම නිසා ප්‍රසම්පාදනය වෙත ඉදිරිපත් නොකළ බැවින්, 2024 වර්ෂය තුළ වැඩ අවසන් කිරීමට නොහැකිවීම, ඇතැම් ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුනොවීම මත ව්‍යාපෘති කටයුතු ඉදිරියට ගෙන යා නොහැකිවීම, ඇතැම් ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු 2024 වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට නොහැකිවීම සහ මූලික පිරිවිතර සකස්කිරීමට නොහැකිවීම නිසා ප්‍රසම්පාදනය වෙත ඉදිරිපත් නොකිරීම දක්වා තිබුණි.	

3.2 බැරකම් හා බැදීම්වලට එළැඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි සටහන්කර ඇති නමුත් භාණ්ඩාගාර සටහනෙහි (SA-92) සටහන් නොවූ බැරකම්වල මුළු වටිනාකම රු.1,054,503ක් විය.	විගණනය හා එකගවන බවත්, ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බැරකම් වාර්තාකිරීම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු බවට අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදුන් බවත් දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී බැරකම් වාර්තා කිරීම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වේ.
(ආ)	දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් ප්‍රකාශනයෙහි, බැරකම් ලේඛනයෙහි හා භාණ්ඩාගාර සටහනෙහි (SA-92) ද ඇතුළත් නොවූ රු.4,598,740ක බැරකම් 2025 වර්ෂයේ දී වවුචර් මගින් නිරවුල්කර තිබුණි.	විගණනය හා එකගවන බවත්, ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී බැරකම් වාර්තාකිරීම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු බවට අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදුන් බවත් දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී බැරකම් වාර්තා කිරීම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වේ.
(ඇ)	දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් ප්‍රකාශනයෙහි, බැරකම් ලේඛනයෙහි ඇතුළත් වුව ද, භාණ්ඩාගාර සටහනෙහි (SA-92) ඇතුළත් නොවූ වැය විෂය අංක 226-1-1-0-1402 යටතේ මුළු වටිනාකම රු.675,671ක බැරකම් 2025 වර්ෂයේදී වවුචර් මගින් නිරවුල්කර තිබුණි.	විගණනය හා එකගවන බවත්, ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී බැරකම් වාර්තාකිරීම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු බවට අදාළ නිලධාරින්ට උපදෙස් ලබාදුන් බවත් දක්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී බැරකම් වාර්තා කිරීම් නිවැරදිව ඉදිරිපත් කළ යුතු වේ.

3.3 ප්‍රධාන ගණකාධිකාරී / ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	දෙපාර්තමේනතුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යමින් එම පද්ධතිය සමාලෝචනයකර එහි ප්‍රගතිය විගණනය වෙත දැනුවත්කර නොතිබුණු බවත්, දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් මූල්‍ය සමාලෝචනය සිදුකර ඇති බවත්, ඉදිරියේ දී ප්‍රගති සමාලෝචන රැස්වීමෙහි පිටපතක් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම		
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i) මු.රෙ. 447(1)	පොදු 138 වැය ලෙජරයෙහි ප්‍රවර්ථන වර්ෂය සඳහා යොමුගත මුදල් පෙර වර්ෂයන් සඳහා ගිණුම්ගත බැදීම් තීරුවෙහි රෙගුලාසි පරිදි		

		ගිණුම්ගත බැදීම් තීරුවෙහි තොරතුරු ඇතුළත්කර නොතිබුණු අතර, ඉතිරිව ඇති නිවැරදි මුදල් ප්‍රමාණය දැනගැනීමට හැකිවන ලෙස බැදී ඇති බැරකම් ද දක්වා නොතිබුණි.	නිවැරදිව හඳුනාගත් ගනුදෙනු ඇතුළත්කර ඇති බවත්, අනෙකුත් වාර්තා වී ඇති සියලු බැදීම් වෙනුවෙන් ද වැය ලෙජරය තුළ ප්‍රතිපාදන අවුරා තැබීමට කටයුතුකර ඇති බවත් තව ද, පෙර වර්ෂයට අදාළ බැදීම් සඳහා පොදු 138 වැය ලෙජරයෙහි සටහන් කිරීමට ද විෂය භාර නිලධාරින් දැනුවත් කරන ලද බවත් දක්වා තිබුණි.	බැදීම් සටහන් කිරීමට කටයුතු කළ යුතු වේ.
	(ii) මු.රෙ. 750(1)	දෙපාර්තමේන්තුව සතුව පවතින සංචිත හා වෙන්කළ වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරුකර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු සියලුම වාහන ආගාමික හා විගාමික නීති උල්ලංඝණය කරන විදේශිකයන් අත්අඩංගුවට ගැනීම සහ විමර්ශන කටයුතු සඳහා අවස්ථානුකූලව යොදවන බැවින්, මෙම වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීම මගින් එම විමර්ශන කටයුතු සඳහා යෙදවීම ගැටළුකාරී වන බවත්, විමර්ශනය සඳහා දිගින් දිගටම එක වාහනයක් භාවිතා කිරීම ඔත්තුකරුවන්හට වාසි සහගත විය හැකි බවත්, මේ වන විට සියලුම වාහනවල දෙපාර්තමේන්තුවේ නම සහිත පුවරු ඉදිරියට පෙනෙන ආකාරයෙන් රථයේ ඉදිරිපස වීදුරුව ඇතුළතින් තබා ඇති බවත් තවදුරටත් දක්වා තිබුණි.	යොමුගත මුදල් රෙගුලාසි පරිදි වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කළ යුතු වේ.
(ආ)	2016 දෙසැම්බර් 22 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	දෙපාර්තමේන්තුව සතු වාහන 02 හැර ඉතිරි වාහනවල 2013 වර්ෂයෙන් පසුව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු වාහන 06ක ඉන්ධන දහන පරීක්ෂාව මේ වන විට සිදුකර ඇති බවත්, සංචිත වාහන රාජකාරී	යොමුගත චක්‍රලේඛ පරිදි ඉන්ධන වාහන පරීක්ෂාව කළ යුතු වේ.

			කටයුතුවලට බාධා නොවන ආකාරයෙන් ඉදිරියේ දී ඉන්ධන පරීක්ෂාව සඳහා යොමුකිරීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි.	
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 (ආ) වගන්තිය	ඍජුකොන්ත්‍රාත් ක්‍රමය භාවිතාකළ යුත්තේ විශේෂ අවස්ථානුගත කරුණු යටතේ පමණක් වුව ද, මානව සම්පත් කළමනාකරණ මොඩියුලය ප්‍රසම්පාදන සඳහා තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමයක් තෝරාගැනීම වෙනුවට ඍජුකොන්ත්‍රාත් ක්‍රමය අනුගමනයකර තිබුණි.	දෙපාර්තමේන්තුවේ මෘදුකාංගය පිළිබඳ කටයුතු සිදුකරන ප්‍රධාන ආයතනය Informatics ආයතනය වන බවත්, ඔවුන් යටතේ දැනටමත් 2003 වර්ෂයේ හඳුන්වාදුන් මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වෙමින් පවතින බවත්, තව ද, එම මොඩියුලය දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්යයන් සිදුකිරීමට ප්‍රමාණවත් නොවන බවත්, එබැවින් නව මානව සම්පත් කළමනාකරණ මොඩියුලයක අවශ්‍යතාවය ඇති වී තිබූ බවත්, ඒ අනුව පැරණි මොඩියුලයේ කාර්යයන් ද ඇතුළත්ව නව මොඩියුලය සකස්කළ යුතුව ඇති බැවින් හා විශේෂයෙන් මෙම මොඩියුලය හරහා වීසා, ගමන් බලපත්, පුරවැසි, ප්‍රත්‍යන්ත පාලන, ජීවමිතික දත්ත පද්ධති, අසාදු ලේඛන පද්ධති සඳහා පරිශීලකයන් කළමනාකරණය කරනු ලබන පද්ධතිය සමග ඒකාබද්ධ වන හෙයින් පුද්ගලික දත්ත ආරක්ෂාව හා පරිගණක පද්ධති ආරක්ෂාව ද සලකා බලමින් ඍජු මිලදීගැනීම් සඳහා වූ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සීමාව වූ රුපියල් මිලියන 200ක් වන බැවින්, රු.29,850,000කට උක්ත	යොමුගත ප්‍රසම්පාදන මාර්ග උපදේශන පරිදි කටයුතු කළ යුතු වේ.

			මොඩියුලය සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා Informatics ආයතනය තෝරාගෙන තිබූ බවට තවදුරටත් දක්වා තිබුණි.	
(ඈ)	2016 අගෝස්තු 15 දිනැති අංක 01/2016 දරන අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ චක්‍රලේඛය	සෑම වසරකම ජනවාරි 01 දිනට රාජකාරී ගමන් බලපත්‍රලාභීන් එම තනතුරුවල රැඳී සිටින බවට අදාළ ආයතන ප්‍රධානීන්ගෙන් තහවුරු කොටගෙන අවශ්‍ය පියවර ගැනීමට ක්‍රියාකළ යුතු වුව ද, එසේකර නොතිබුණි.	සෑම ජනවාරි 01 වන දිනකම අදාළ නිලධාරීන් තනතුරුවල රැඳී සිටින්නේ ද යන්න තහවුරුකර ගැනීම ප්‍රායෝගික ගැටලු මතු කරන බව අවස්ථා කිහිපයකදීම විගණනය වෙත දැනුම් දී ඇති බවත්, එක් එක් රාජ්‍ය ආයතන වෙත මෙම දෙපාර්තමේන්තුවේ මාර්ගගත ප්‍රවේශයක් හරහා තොරතුරු යාවත්කාලීන කිරීමේ පහසුකම් සැපයීම පිළිබඳවත් එම අභ්‍යන්තර කටයුතු චක්‍රලේඛ අංක 01/2016 සමාලෝචනයට කිරීමටත් අවශ්‍ය කටයුතු සාකච්ඡා කෙරෙමින් පවතින බවත් දක්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු වේ.
(ඉ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 1.3.1 ඡේදය	සෑම වාහනයක් සඳහාම වර්ෂ 05කට වරක් තක්සේරුවක් ලබාගැනීම අනිවාර්යය වුවත්, මෙම දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් එකී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	වාහන තක්සේරු කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවේ නිලධාරියෙකු පත්කර දෙන ලෙස ඉල්ලා ලිපියක් භාරදුන් බවත්, ඒ අනුව ලිපියට පිළිතුරු ලෙස දෙපාර්තමේන්තුව සතුව පවතින සියලු රථවාහන එක්දිනක පරීක්ෂා කිරීමට නිලධාරියෙකු පත්කර, දන්වන බවත් දක්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටුනොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අදාළ ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දී වැය විෂය අංක 226-1-1-0-2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම යටතේ කොළඹ වරාය පරිගණක ජාල සැකසුම් වවුනියා ප්‍රාදේශීය කාර්යාලය සඳහා පරිගණක ජාල සැකසුම් කටයුතු හා ප්‍රාදේශීය කාර්යාල සඳහා යුපීඑස් උපකරණ 7ක් මිලදීගැනීමට ද සැලසුම්කර තිබුණි. ඒ සඳහා මුළු වටිනාකම රුපියල් මිලියන 46.1ක් ඇස්තමේන්තුකර තිබුණු අතර, වර්ෂය අවසානයට එහි මූල්‍ය ප්‍රගතිය සියයට 0ක් වූ අතර, භෞතික ප්‍රගතිය සියයට 5ක් විය.	• **කොළඹ වරාය පරිගණක ජාල සැකසුම** 2024 වර්ෂයේ දී ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර තිබුණ ද, වාර දෙකක දී තාක්‍ෂණික ඇගයීම් කමිටු වෙනස්වීම මත ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදවීමත් ව්‍යාපෘතිය සඳහා ඉතිරි වී තිබූ කාලය සීමිතවීමෙන් තරගකාරීත්වය අඩුවිය හැකි නිසා 2025 වසරේ මෙම ව්‍යාපෘතිය නිමකිරීමට හැකි බවත් දක්වා තිබුණි. • **වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය සඳහා පරිගණක ජාල සැකසුම** හදිසි අවශ්‍යතාවය මත කාර්යය ඉටුකර ඇති බවත්, අදාළ ගෙවීම් සිදුකිරීම සඳහා කමිටුවක් පත්කිරීමට මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය කටයුතු යොදා ඇති බවත්, අදාළ කමිටු තීරණය හා අමාත්‍යාංශයෙන් ලැබෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු කරනු ලබන බවත් දක්වා තිබුණි. • **ප්‍රාදේශීය කාර්යාල සඳහා UPS 07ක් මිලදීගැනීම** 2024 වර්ෂයේ දී ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භකළ ද කාලය ප්‍රමාණවත් නොවීම මත වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ ලංසු	සැලසුම්කළ පරිදි කාර්යයන් ඉටුකළ යුතු වේ.

		කැඳවන ලද බවත් එහි දී ලංසු ඉදිරිපත් කිරීමට සාරානුකූලව ප්‍රතිචාර නොදැක්වීම මත 2025 වර්ෂයේ දී ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය සිදු කිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කළ බවත් දක්වා තිබුණි.	
(ආ)	සමාලෝචිත වර්ෂයේ දී වැය විෂය අංක 226-1-1-0-2106 මෘදුකාංග සංවර්ධනය යටතේ වාහන නඩත්තු, රී-ඉන්වෙන්ට්‍රි, මානව සම්පත් II, දත්ත සංක්‍රමණ මොඩියුලයන් ස්ථාපිත කිරීම සඳහා මුළු වටිනාකම රුපියල් මිලියන 54.2ක් ඇස්තමේන්තුකර තිබුණි. 2024 වර්ෂය අවසානයට එහි මූල්‍ය ප්‍රගතිය මෙන්ම භෞතික ප්‍රගතිය ද සියයට 0ක් වූ අතර, අදාළ කාර්යය සැලසුම්කළ පරිදි ඉටුකර නොතිබුණි.	මූල්‍ය ප්‍රගතිය මෙන්ම භෞතික ප්‍රගතිය ද සියයට 0ක් වීමට හේතුන් ලෙස මෘදුකාංග සංවර්ධනය යටතේ වාහන නඩත්තු සහ රී-ඉන්වෙන්ට්‍රි මොඩියුලයන් සිදුකිරීමට වර්ෂය මුල දී සැලසුම්කර තිබුණ ද, පසුව දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය වෙනස් වීම මත එවැනි මෘදුකාංග සංවර්ධනය කිරීමට සිදුනොවීම, මානව සම්පත් II මොඩියුලයට අදාළව දෙපාර්තමේන්තු අවශ්‍යතා නිරන්තරයෙන් වෙනස් කිරීම්වලට බඳුන් වූ බැවින්, එහි කටයුතු ප්‍රමාදවීම හා දත්ත සංචරණ මොඩියුලය ස්ථාපිතකර දත්ත සංචරණය සඳහා කිහිපවරක් දරන ලද උත්සාහයන් තාක්ෂණික නොගැළපීම් හේතුවෙන් ව්‍යාර්ථ වූ බව දක්වා තිබුණි. තව ද, 2025.05.28 දින වන විට මානව සම්පත් II මොඩියුලය පාලන අංශයේ ස්ථාපිතකර පරිශීලක පරීක්ෂණ මට්ටමේ පවතින බවත්, දත්ත සංචරණ මොඩියුලයට අදාළව දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන තිබූ Application Server Architecture සහ Database Server Architecture බවත්, දත්ත සංචරණය සිදුකිරීමට තාක්ෂණික නොගැළපීම් ඇති වූ බැවින්, ඒ සඳහා සුදුසු Server එකක් මිලටගැනීමට මෙම වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර ඇති බවත් දක්වා තිබුණි.	සැලසුම්කළ පරිදි කාර්යයන් ඉටුකළ යුතු වේ.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දී වැය විෂය අංක 226-1-1-0-2106 මෘදුකාංග සංවර්ධනය යටතේ Change request, User interface updation හා Change of border control සඳහා පිළිවෙලින් රුපියල් මිලියන	සැලසුම්කළ පරිදි කාර්යයන් ඉටු නොවීමට හේතුන් ලෙස Change request සඳහා කටයුතු කරනුයේ දෙපාර්තමේන්තුව තුළ පැනනඟින කාලානුරූපී අවශ්‍යතා පදනම්කර ගනිමින් වන බවත්, ඒ වෙනුවෙන් ඇස්තමේන්තු	සැලසුම්කළ පරිදි කාර්යයන් ඉටුකළ යුතු වේ.

84ක්, රුපියල් මිලියන 9.5ක් හා රුපියල් මිලියන 84.5ක් ඇස්තමේන්තුකර තිබුණි. වර්ෂය අවසානයට එහි මූල්‍ය ප්‍රගතිය සියයට 0ක් වූ අතර, භෞතික ප්‍රගතිය සියයට 0ත් සියයට 10ත් අතර පරාසයක පැවතුණි. ඒ අනුව අදාළ කාර්යය සැලසුම්කළ පරිදි ඉටුකර නොතිබුණි.	කරනුයේ පසුගිය වර්ෂයට සාපේක්ෂව බවත්, 2024 වර්ෂයේ ඉදිරිපත් වූ Change Request ප්‍රමාණය සාපේක්ෂව අඩුවීම සහ පසුගිය වර්ෂය තුළ දෙපාර්තමේන්තුව මුහුණ දුන් අර්බුදකාරී තත්ත්වයන් නිසා ඉදිරිපත් වූ ඉල්ලීම්වලට අදාළව අවශ්‍ය අනුමැතීන් ප්‍රමාදවීම මත වර්ෂය තුළ ගෙවීම් සම්පූර්ණ කිරීමට නොහැකිවීම, User Interface Updating සඳහා දෙපාර්තමේන්තුව දැනට භාවිත කරනුයේ 2003 වර්ෂයේ ලබාගත් version එක වන බවත්, යාවත්කාලීන කිරීමට පවත්නා Database Serverහි ඉඩ ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ බැවින්, නව Database Server එකක් සපයාගත් පසු අදාළ යාවත්කාලීන කිරීම සිදුකිරීමට තීරණය කිරීම හා Change of Border Control මෘදුකාංගයට අදාළව නිරීක්ෂණය සඳහා පැමිණි සිංගප්පූරු කණ්ඩායමෙහි නිර්දේශය වූයේ සම්පූර්ණ පද්ධතිය සමාලෝචනයකර Business Process Re-engineering කළ යුතු බවත්, එම කටයුතුවලින් පසු මෙම කාර්යය ඉටුකිරීමට තීරණය කිරීමත් දක්වා තිබුණි.	

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයෙන් ලබාගත් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය සේවාව යටතේ ගමන් බලපත්‍ර අයදුම්පත් 133,315ක් ලැබී තිබූ අතර, ඉන් ගමන් බලපත්‍ර 75,832ක් එනම් සියයට 57ක් පමණක් වර්ෂය තුළ නිකුත්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය සේවාව යටතේ ලද ගමන් බලපත්‍ර අයදුම්පත්වලින් 57,483ක අයදුම්පත් ප්‍රමාණයක් 2024 දෙසැම්බර් 31 දිනට නිකුත් කිරීමට නොහැකි වී තිබුණි.	2024 වර්ෂයේ දී ප්‍රමාණවත් තරම් හිස් ගමන් බලපත් තොගයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබූ නිසා සාමාන්‍ය සේවය යටතේ ඉල්ලුම් කරන ලද අයදුම්පත්වලින් අවශ්‍යතාවය පෙළ ගස්වා ප්‍රමුඛතාවය මත නිකුත්කරන ලද බව දක්වා තිබුණි.	ලැබී ඇති ගමන් බලපත්‍ර අයදුම්පත් සඳහා කඩිනමින් ගමන් බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ.

4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 ප්‍රකාරව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටු දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පත්කරනු ලැබිය යුතු නමුත්, EPOSN PM 520 වර්ගයේ ස්ටිකර් මුද්‍රණ යන්ත්‍ර 04ක් මිලදීගැනීම සඳහා අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර නොතිබුණු අතර, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4(ඇ) ප්‍රකාරව වීසා මොඩියුලය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ප්‍රසම්පාදනය සඳහා පත්කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටුවට රේඛීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර ප්‍රසම්පාදන විෂය සම්බන්ධයෙන් දැනුමක් ඇති අයෙකු පත්කර නොතිබුණි.	ඉදිරි ප්‍රසම්පාදනයන්හි දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීමට සටහන්කර ගන්නා ලද බවට දක්වා තිබුණි.	මිලදීගැනීම් සිදු කිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.
(ආ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.12(අ) ප්‍රකාරව, තාක්ෂණික ඇගයීම් කමිටුවල සියලු සාමාජිකයන්, එම කමිටුවල පළමු රැස්වීමේ දී සිදුවන කටයුතු පිළිබඳව වාණිජමය රහස්‍යභාවය පිළිබඳව තමන් ගරු කරන බව, තමන්ගේ අපක්ෂපාතීභාවය සහ අවංකභාවය පිළිබඳව සහ පෞද්ගලික සම්බන්ධතාවයක් නොමැති බව පිළිබඳව ප්‍රතිඥා දෙමින්, නියමිත ආකෘතිපත්‍රයෙහි වූ ප්‍රකාශයක් අත්සන් කිරීමට නියමකර ඇති නමුත්, වීසා මොඩියුලය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ප්‍රසම්පාදනය සඳහා පත්කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම ප්‍රකාශය ලබා දී නොතිබුණි.	ඉදිරි ප්‍රසම්පාදනයන්හි දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීමට සටහන්කර ගන්නා ලද බවට දක්වා තිබුණි.	මිලදීගැනීම් සිදු කිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.

(ඇ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ප්‍රකාරව සහ ඊට අනුරූපීව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2024 ජුනි 25 දිනැතිව නිකුත්කර ඇති මාර්ගෝපදේශ 40 ප්‍රකාරව, සෘජු කොන්ත්‍රාත්කරන පටිපාටිය අනුගමනය කිරීමේ දී, සුළු කොන්ත්‍රාත් - භාණ්ඩ සහ සේවා සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය නිර්දේශ කිරීම සඳහා වූ අධිකාරී බලසීමාව රු.500,000 දක්වා නියමකර තිබුණද, මෙම දෙපාර්තමේන්තුවට මුදල් ගණනය කිරීමේ යන්ත්‍ර (Cash Counting) 03ක් රු.1,196,700ක (Without VAT) වටිනාකමට මිලදී ගෙන තිබුණි.	බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ විමර්ශන චාරිකාවේ දී හිටපු ජනාධිපති ලේකම් උපදෙස් මත සරප් හා වීසා අනුමත කිරීමේ කවුළු 06ක් ක්‍රියාත්මක කළ යුතු බවත්, දෙපාර්තමේන්තු මෘදුකාංග හා අනුකූල වන බැවින් සෘජු මිලදීගැනීම් යටතේ අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 යටතේ මිලදීගෙන ඇති බවත් දක්වා තිබුණි.	මිලදීගැනීම් සිදු කිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.
(ඈ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006හි 4 වැනි පරිච්ඡේදයේ 4.2.1(අ) හා (ආ) වගන්ති ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස්කළ යුතු වන අතර, අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගතකර තිබිය යුතු වුව ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂයක කාලයක් සඳහා පමණක් සකස්කර තිබුණි.	විගණනය හා එකගවන බවත්, ඉදිරියේ දී රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කිරීමට අදාළ වගකිව යුතු නිලධාරින්ට උපදෙස් දෙන ලද බවත් දක්වා තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙලකළ යුතු වේ.
(ඉ)	EPOSN PM 520 වර්ගයේ ස්ටිකර් මුද්‍රණ යන්ත්‍ර 04ක් මිලදීගැනීම සඳහා ලංසු විවෘත කිරීමේ කමිටුවක් මගින් එහි සාමාජිකයන් දෙදෙනෙකු විසින් ලංසු විවෘත කිරීම සිදුකර තිබුණ ද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(අ) ප්‍රකාරව, මෙම කමිටුව පත්කිරීම ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමතකර නොතිබුණි.	ඉදිරි ප්‍රසම්පාදනයන්හි දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීමට නිලධාරින්ට උපදෙස් දෙන ලද බව දක්වා තිබුණි	මිලදීගැනීම් සිදු කිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.

(ඊ)	වෙළඳපොළ මිල සැඳැහුම් ක්‍රමය (shopping) යටතේ රු.500,000ක් දක්වා සිදුකරන ප්‍රාග්ධන වත්කම් මිලදීගැනීමේ දී ලංසු 03ක් ලබාගත යුතු වුව ද, EPOSN PM 520 වර්ගයේ ස්ටිකර් මුද්‍රණ යන්ත්‍ර 04ක් මිලදීගැනීම සම්බන්ධයෙන් එසේ කටයුතුකර නොතිබුණි.	පෙර වර්ෂයේ දී ද මෙකී ප්‍රසම්පාදනය සඳහා මිලගණන් කැඳවීමට කටයුතුකර ඇති නමුත්, කිසිදු ආයතනයකින් මිල ගණන් ලබා දී නොමැති බව ගොනුවේ අංක 01 දරන මිනිත සටහන අනුව ප්‍රකාශකර ඇති බවත්, හදිසි අවශ්‍යතාවය මත 2024 වර්ෂයේ දී අදාළ ප්‍රසම්පාදනය සඳහා නැවතත් ආයතනයන් 10කින් ලංසු කැඳවීමට කටයුතුකර තිබුණ ද, මිල ගණන් ලබා දී ඇත්තේ ආයතනයන් දෙකකින් පමණක් බව විෂය ගොනුව අනුව නිරීක්ෂණය වන බැවින්, ඒ අනුව ආයතන දෙකක ලංසු ලේඛන පමණක් තාක්‍ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සඳහා යොමුකර ඇති බව දක්වා තිබුණි.	මිලදීගැනීම් සිදු කිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.
(උ)	ප්‍රසම්පාදන සැලැස්ම අනුව 226-1-1-2106 වැය ශීර්ෂය යටතේ මූල්‍ය ප්‍රතිපාදන රුපියල් මිලියන 32ක් වීසා මොඩියුලය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ප්‍රසම්පාදනය සඳහා වෙන්කර තිබුණු නමුත්, මෙම මිලදීගැනීම සඳහා සම්පූර්ණ වියදම රු.37,751,950ක් වැයකර තිබූ අතර, නව ප්‍රසම්පාදන සැලැස්මෙහි අනුමත මුදලට වඩා රු.5,751,950ක මුදලක් වැඩියෙන් වැයකර තිබුණි.	ප්‍රසම්පාදන සැලැස්ම අනුව 226-1-1-2106 වැය විෂය යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදන රුපියල් මිලියන 32ක් වන බවත්, Informatics ආයතනයෙන් වීසා මොඩියුලය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් ලබාදෙන ලද මිල රු.36,993,178ක් වන බවත්, රු. 500,000ක වට්ටම් මුදලක් ලබාදීමෙන් පසු ලංසු අගය රු.31,993,178ක් දක්වා අඩුකිරීමට Informatics ආයතනය එකග වූ බවත්, ඒ අනුව වවුචරපත් වටිනාකම රු.37,751,950ක අගයක් ගෙන ඇත්තේ රු.31,993,178 + VAT වන බවට දක්වා තිබුණි. ආයතනික අවශ්‍යතාවය මත මෙම කාර්යය ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා ඉටුකළ බවත්, ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්ම වූ මුදල අනෙකුත් ව්‍යාපෘති අත්හැරීම මගින් ප්‍රතිපාදන ලබාගෙන තිබූ බවටත් දක්වා තිබුණි.	ප්‍රසම්පාදන සැලැස්මේ අනුමත මූල්‍ය ප්‍රතිපාදන සීමාව තුළ කටයුතු කළ යුතු වේ.

4.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව සඳහා පිරිවැය රු.29,850,000 වූ මානව සම්පත් කළමනාකරණ මොඩියුලයෙහි Phase-I ස්ථාපිත කිරීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 29 දින රු.16,200,000 ගෙවීම්කර තිබූ නමුත්, ඊට අදාළව සිදුකළ යුතුව තිබූ UAT (User Accepting Testing) පරීක්ෂාව හා වගකිව යුතු නිලධාරියෙකුගේ විධිමත් නිර්දේශයකින් ද තොරව අදාළ ගෙවීම සිදුකර තිබුණි. මෙම වාර්තාවේ දින දක්වා මෙම මොඩියුලය ආයතනය තුළ ස්ථාපිත කිරීමක් හෝ කිසිදු ආකාරයක භාවිතයට ගැනීමක් හෝ සිදුකර නොතිබුණි.	මානව සම්පත් මොඩියුලය ස්ථාපනය කිරීම සඳහා එම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි වෙන්කරන ලද මුදල ප්‍රමාණවත් නොවූ බැවින්, Phase-1 හා Phase-II ලෙස මෙම ව්‍යාපෘතිය අදියර දෙකකට වෙන්කිරීමට සිදු වූ බවත්, Phase-1 පමණක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඉදිරිපත්කර තිබූ බවත්, එබැවින් Phase-I සඳහා පමණක් ගෙවීම් කටයුතු විධිමත් නිර්දේශ මත සිදුකර තිබූ බවට දක්වා තිබුණි. මොඩියුලයේ Phase-I හා Phase-II දැනට දෙපාර්තමේන්තුවේ Server පද්ධතිය තුළ ස්ථාපනයකර ඇති බවටත්, මේ වන විට එහි පරීක්ෂා කිරීම් හා අනෙකුත් පද්ධතීන් සමග ඒකාබද්ධ කිරීමට අදාළ මූලික කටයුතු සිදුවන බවටත්, එම කටයුතු කෙටි කාලයක් තුළ අවසන් කිරීමට නියමිත බවත් එම කටයුතු අවසන් වූ වහාම පූර්ණ වශයෙන් භාවිතා කිරීමට හැකි බවටත් දක්වා තිබුණි.	වගකිව යුතු නිලධාරියෙකුගේ විධිමත් නිර්දේශයකින් යුතුව ගෙවීම් සිදුකළ යුතු අතර, එසේ ගෙවීම් කිරීමේ දී එය භාවිතයට ගැනීමට සුදුසු තත්ත්වයක පවතින්නේ ද යන්න පිළිබඳ තහවුරුවක් ලබාගත යුතු වේ.
(ආ)	මානව සම්පත් කළමනාකරණ මොඩියුලයෙහි Phase-I සඳහා වන රු.16,200,000ක ගෙවීමට අදාළ චෙක්පත 2024 ජූලි 31 දින වන විටත් නිකුත්කළ නමුත්, ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පතක් ලෙස පැවති අතර, 2024 අගෝස්තු මාසයේ දී එය ගෙවීමට ඉදිරිපත් වී තිබුණි. ඒ අනුව රු.16,200,000ක මුදලක් මාස 6කට අධික කාලයක් ගෙවීම් අවහිරකර තබාගෙන තිබුණි.	විගණනය හා එකගවන බවත්, 2024 අගෝස්තු මස චෙක්පත නිෂ්කාශනය වී ඇති බවත් දක්වා තිබුණි.	නිකුත්කළ චෙක්පත් ගෙවීම් අවහිරවීමට හේතු සොයා බැලිය යුතු වේ.

(ඇ)	2022, 2023 හා 2024 (ජනවාරි සිට අප්‍රේල් 16 දක්වා) වර්ෂ සඳහා විද්‍යුත් සංචරණ අනුමැතිය නම් වූ (ETA) පද්ධතිය අදාළ සමාගම විසින් පවත්වාගෙන යාමේ දී එකී පද්ධතියේ සේවා හා නඩත්තු වෙනුවෙන් ගෙවිය යුතු මුදල හා සමාගමේ ලාංඡනය (ETA) පද්ධතියට අදාළ වෙබ්අඩවියේ ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් සමාගම විසින් 2021, 2022 හා 2023 වර්ෂ සඳහා වසරකට රු.1,000,000 බැගින් රු.3,000,000ක් ද අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතුකර නොතිබුණි.	2023 වර්ෂයේ ETA පහසුකම් ලබාගැනීම වෙනුවෙන් මාසික නඩත්තු, දුරකථන ඇමතුම් හා ඔරකල් දත්ත පද්ධතිය සඳහා රු.13,633,637 මුදල අදාළ සමාගම වෙත ගෙවීම් සිදුකිරීම සඳහා වවුචර්පත් සකස්කර මු. රෙ. 115 අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව දක්වා දක්වා තිබූ අතර, 2024 වර්ෂයේ ETA පහසුකම වෙනුවෙන් ගෙවිය යුතු මුදල් ගෙවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන ගෙවීමට හැකි බව ද දක්වා තිබුණි. අදාළ සමාගමේ ලාංඡනය (ETA) පද්ධතියට අදාළ වෙබ්අඩවියේ ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුදල් ලබාදෙන ලෙස දන්වා 2021.08.06, 2022.10.26, 2023.04.21, 2024.08.05 හා 2024.12.20 දිනැතිව ලිපි යොමුකර ඇති බවත්, අදාළ මුදල අයකර ගැනීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි.	අදාළ සමාගම මගින් දෙපාර්තමේන්තුවට අයවිය යුතු හා සමාගමට ගෙවිය යුතු ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඈ)	සාමාන්‍ය ක්‍රමවේදය තුළ මාර්ගගත ක්‍රමය ඔස්සේ හා අයදුම්කරුවන් විසින් පෞද්ගලිකව දෙපාර්තමේන්තුවට භාරදුන් විදේශ ගමන් බලපත්‍ර පිළිබඳ 2024 ජනවාරි මාසයේ දින10ක නියැදි පරීක්ෂාවට අනුව ගමන් බලපත්‍ර නව නිකුත් කිරීම් හා අලුත්කිරීම් පිළිබඳ පරීක්ෂාවේ දී අයදුම්පත්‍ර භාරදුන් දිනයේ සිට ගමන් බලපත්‍රය මුද්‍රණය කිරීම දක්වා වූ කාලය මාස 6කට වඩා පමාවීම් අවස්ථා 284ක් පැවතුණි.	මාර්ගගත ක්‍රමයේ සාමාන්‍ය ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කරනු ලැබූ අයදුම්කරුවන්ගේ ඇඟිලි සලකුණු දිනයේ සිට මාසයක කාලයක් ගත වූ පසු අදාළ අයදුම්කරුවන් වෙත විදේශ ගමන් බලපත්‍රය නිකුත්කිරීම පෙර සාමාන්‍ය ක්‍රමවේදය වුවත්, 2024 වර්ෂයේ ජූලි මාසයේ සිට දෙපාර්තමේන්තුව සතුව පැවති සීමිත විදේශ ගමන් බලපත්‍ර තොග කළමනාකරණය කිරීමේ පියවරක් ලෙස එලෙස අයදුම්පත් ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලීම් ප්‍රමුඛතාවය මත පමණක් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් විගණනය සිදුකරන අවස්ථාව වන විට ක්‍රියාත්මක වී ඇති බවත්, විගණන විමසුමෙහි සඳහන් අයදුම්පත්‍රවලට අදාළ විදේශ ගමන් බලපත්‍ර ඉහත ක්‍රමවේදය යටතේ ඉල්ලුම්කරුවන්ගේ ප්‍රමුඛතා ඉල්ලීම් මත නිකුත්කරන ලද විදේශ ගමන් බලපත්‍ර වන බවත්, එබැවින් දෙපාර්තමේන්තු වෙබ්අඩවියෙහි සඳහන් පරිදි ඇඟිලි සළකුණු සටහන් ලබාදුන් දින සිට මාසයක කාලයක් තුළ විදේශ ගමන්	සාමාන්‍ය ක්‍රමවේදය තුළ මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්කරුවන් ඇඟිලි සලකුණු සටහන් ලබාදුන් දින සිට මාසයක කාලය තුළ විදෙස් ගමන් බලපත්‍ර නිකුත්කිරීමට කටයුතු කළ යුතු වේ.

		බලපත්‍ර නිකුත්කිරීම සිදුනොකෙරෙන බැවින් ප්‍රමාදයක් සිදුවන බවත් දක්වා තිබුණි.	
(ඉ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 04 ඡේදය ප්‍රකාරව, සියලුම ගණන්දීමේ නිලධාරින් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණු අතර, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.	විගණනය හා එකගවන බවත්, ඉදිරියේ දී රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කිරීමට අදාළ වගකිව යුතු නිලධාරින්ට උපදෙස් දෙන ලද බවත් දක්වා තිබුණි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කළ යුතු වේ.
(ඊ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006හි 4 වැනි පරිච්ඡේදයේ 4.2.1(ඇ) ප්‍රකාරව, ඊළඟ එළැඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.1 ආකෘතියට අනුව පිළියෙල කරනු ලැබිය යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර නොතිබුණි.	විගණනය හා එකගවන බවත්, ඉදිරියේ දී රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කිරීමට අදාළ වගකිව යුතු නිලධාරින්ට උපදෙස් දෙන ලද බවත් දක්වා තිබුණි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙලකළ යුතු වේ.
(උ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ප්‍රකාරව, ශ්‍රී ලංකා රුපියල් 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන්කිරීම සිදුකළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින්	ඉදිරියේ දී රු.500,000 වැඩි සියලු මිලදී ගැනීම් සඳහා ගිවිසුම්ගතවීමට සටහන් කර ගෙන ඇති බව දක්වා තිබුණි.	රු.500,000 වැඩි සියලු මිලදීගැනීම් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීමට කටයුතු කළ යුතු වේ.

	සමාලෝචිත වර්ෂයේ දී සිදුකළ ටෝනර්, කාට්ලේජර් සහ පාරිභෝගික ද්‍රව්‍ය මිලදීගැනීමේ දී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන්කර නොතිබුණි.		
(ඌ)	දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන Lexmark, Brother, Canon, HP, Ricoh සහ Epson වර්ගයේ ටෝනර්, කාට්ලේජර් සහ අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය අඛණ්ඩව එකම සැපයුම්කරුවෙක් වෙතින් මිලදීගෙන තිබූ අතර, එසේ අඛණ්ඩව මිලදීගැනුම් සිදුකිරීමේ දී ඇණවුමේ සඳහන් ප්‍රමාණයන්ගෙන් මුද්‍රණ ලබාගත හැකි ද යන්න පිළිබඳව තත්ත්ව පරීක්ෂාවක් සිදුකර ඇණවුම් කරන භාණ්ඩවල ඵලදායීතාවය අධ්‍යයනයකර වාර්තාවක් ලබාදීමට දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් හෝ කටයුතුකර නොතිබුණි.	එවැනි තත්ත්ව පරීක්ෂාවන් සිදුකරන වෙනත් රජයේ ආයතනවල මෙම ක්‍රියාදාමය සිදුකරන ආකාරය පිළිබඳව අධ්‍යයනයකර ඇගයීම් සහ වාර්තා ලබාදීමේ ක්‍රමවේදයක් සකස්කිරීම සඳහා සටහන්කර ගෙන ඇති බව දක්වා තිබුණි.	අදාළ මිලදීගැනීම් සඳහා ඇගයීම් සහ වාර්තා ලබාදීමේ ක්‍රමවේදයක් ආයතනය තුළ ස්ථාපිත කළ යුතු වේ.
(එ)	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුවේ ගමන් බලපත්, වීසා, පුරවැසි සහතික, ප්‍රත්‍යන්ත පාලන කටයුතු, පුද්ගල පරිපාලන ආදී කටයුතු රාශියක් පරිගණක පද්ධතිය ඇසුරින් සිදුකරනු ලැබීම සඳහා පුද්ගලික සමාගමක් සමග 2003 ජුනි 16 දින ගිවිසුමකට එළැඹ තිබූ අතර, ඒ සඳහා වූ පරිගණක පද්ධති නඩත්තු වියදම් ද ගෙවමින් 2003 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වසර 22 කාලය වෙනුවෙන් එම පුද්ගලික සමාගම වෙතින් සේවා ලබාගෙන තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් අදාළ පරිගණක පද්ධති පවත්වාගෙන යාම මුළුමනින්ම දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	දෙපාර්තමේන්තුවෙහි පරිගණක පද්ධතිය ගුවන් ගමන් බලපත් නිකුත්කිරීම, උසාවි නියෝගයන්ට අදාළ ආසාධුගත කිරීම්, වීසා ලබාදීම්, පුරවැසිභාවය ලබාදීම්, ප්‍රත්‍යන්ත පාලනය වැනි ඉතා සංකීර්ණ කාරණයන් සිදුකරන බවත්, Applications, Database, Networking, Security වැනි අංගයන්ගෙන් සමන්විත වන බැවින් ඒ ඒ අංග කළමනාකරණය කිරීම සඳහා විශේෂ දැනුම ඇති පුද්ගලයන් අත්‍යාවශ්‍ය වන බවත්, මෙතෙක් දෙපාර්තමේන්තුව තුළ තොරතුරු තාක්ෂණ කාර්යමණ්ඩලයක් ස්ථාපනය වී නොමැති බවත්, Software Engineers, Data Base Administrators, Network Engineers and Cyber Security Engineers වැනි නිලධාරින් රාජ්‍ය සේවයට බඳවාගැනීමට මෙතෙක් ක්‍රමවේදයක් නොමැති බවත්, එවැනි තත්ත්වයක් යටතේ රාජ්‍ය සේවයේ ඉහළ තාක්ෂණික දැනුමක් සහිත නිලධාරින්	කලානුරූපීව අදාළ පරිගණක පද්ධති පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ.

		නොමැති වීම නිසා පෞද්ගලික අංශයේ ආයතන හා ගිවිසුම්ගතව මෙම කටයුතු සිදුකර ගැනීමට සිදුවී ඇති බව දක්වා තිබුණි.	
(ඒ)	පද්ධති පවත්වාගෙන යාම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සහ පුද්ගලික සමාගම සමග පවත්වාගෙන යනු ලබන ගිවිසුම් කාලානුරූපීව යාවත්කාලීන කිරීම සිදුකර නොතිබූ අතර, ගිවිසුම් කාලය අවසන් වී මාස කිහිපයකට පසුව පෞද්ගලික ආයතනය විසින් සකසන ලද ගිවිසුම හා ආයතනය සපයන සේවා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන බවට පාලක (තොරතුරු තාක්ෂණ) විසින් ලබාදෙන සහතිකය අනුව ගිවිසුම යාවත්කාලීනකර තිබූ අතර, ගිවිසුම අලුත්කිරීමේ දී ජනවාරි 01 ලෙස පෙරදාතම දිනය යොදා ගිවිසුම අලුත්කර තිබුණි.	මුල් ගිවිසුමට අනුව එළැඹ ඇති වාර්ෂික නඩත්තු ගිවිසුම අනුව ගිවිසුම්ගතවීම සිදු වී ඇති බව දක්වා තිබුණි.	ගිවිසුම් කලානුරූපීව යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවරගත යුතු වේ.
(ඔ)	ගිවිසුම් කාලානුරූපීව යාවත්කාලීන කිරීම සිදුනොවීම නිසාවෙන්, පද්ධති ක්‍රියාකාරීත්වයේ දෝෂ සහගත තත්ත්වයන් ඇති වුවහොත්, ඉන් දෙපාර්තමේන්තුවට විය හැකි හානිය සම්බන්ධයෙන් කිසිදු නීත්‍යානුකූල රැකවරණයක් ලැබී නොතිබුණි.	වර්තමානය වන විට ගිවිසුම් කාලානුරූපීව යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම නිසා ඉදිරියේ දී නීත්‍යානුකූල බව පිළිබඳ ගැටළු ඇතිවීමේ අවදානම අඩුවන බව දක්වා තිබුණි.	ගිවිසුම් කලානුරූපීව යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවරගත යුතු වේ.
(ඕ)	දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන මෙම පරිගණක පද්ධතිවල සංවර්ධනය කිරීම්, සංශෝධනය කිරීම ආදිය මෙම පෞද්ගලික ආයතනයේ නිලධාරීන් මගින් සිදුකිරීම නිසා දෙපාර්තමේන්තුවේ තොරතුරු පිටතට ගලායාම, එම තොරතුරු භාවිතා කරමින් වැරදි හෝ වංචා සිදුකිරීමට ඉඩකඩ පැවතීම සහ ගමන් බලපත්, වීසා, පුරවැසි සහතික හා ප්‍රත්‍යන්ත පාලන යන	දෙපාර්තමේන්තුවෙහි පරිගණක පද්ධති පවත්වාගෙන යාමට අවශ්‍ය තොරතුරු තාක්ෂණ කාර්යමණ්ඩලයක් මෙතෙක් ස්ථාපනය වී නොමැති බවත්, Software Engineers, Data Base Administrators, Java Engineers වැනි නිලධාරීන් රාජ්‍ය සේවයට බඳවාගැනීමේ හැකියාවක් ද නොමැතිවීම හේතුවෙන් පෞද්ගලික අංශයේ ආයතන හා ගිවිසුම්ගතව මෙම කටයුතු සිදුකර ගැනීමට සිදුව ඇති බව දක්වා තිබුණි.	පද්ධති පවත්වාගෙන යාමට අවශ්‍ය තොරතුරු තාක්ෂණ කාර්යමණ්ඩලයක් ආයතනය තුළ ස්ථාපනය කිරීමට අවශ්‍ය පියවරගත යුතු වේ.

	පද්ධතීන්වල පෞද්ගලිකත්වය හා රහස්‍යභාවය ආරක්ෂා නොවීම යනාදී කාරණා සම්බන්ධයෙන් අවදානමක් පවතී.		
(ක)	පද්ධති මගින් භාවිතාකරනු ලබන මෘදුකාංග සඳහා පරිශීලක අත්පොත් හා ගැලීම් සටහන් නොතිබුණු අතර, පද්ධතියේ ප්‍රභව කේතවල අයිතිය තෙවන පාර්ශවයන් භාරයේ පැවතුණි.	2003 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව සතුව මූලිකවම පැවති ප්‍රභව කේතය වුවත්, දෙපාර්තමේන්තු අවශ්‍යතාවය අනුව වරින් වර මෙම ප්‍රභව කේත වෙනස් වී ඇති බවත්, එහි අයිතිය සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බවත්, ඒ පිළිබඳව උපදෙස් ලැබුණු පසු අදාළ උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිත බවත් එසේම මෘදුකාංග සඳහා පරිශීලක අත්පොත් හා ගැලීම් සටහන් ලබාගැනීමට හැකියාවක් පවතින බවත් දක්වා තිබුණි.	තෙවන පාර්ශව සතුව පවතින පද්ධතිවල ප්‍රභව කේත අයිතීන්, දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට අවශ්‍ය පියවරගත යුතු වේ.
(ග)	සමාලෝචිත වර්ෂයට මියගිය නිලධාරින්ගෙන් වසර 5කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.53,257ක්, විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් වසර 3-5 දක්වා වූ කාලයක සිට අයවිය යුතු රු.53,565ක්, 2021 නොවැම්බර් 09 දින වැඩ තහනම් කළ බලයලත් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.179,628ක් හා සේවය අතහැර ගොස් ඇති නිලධාරින් 04දෙනෙකුගෙන් වසර 1 සිට වසර 10 වැඩි කාලසීමාවක් තුළ අයවිය යුතු රු.516,874ක් වූ ආපදා ණයශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.	මියගිය නිලධාරියාගෙන් අයවිය යුතු ණය ශේෂය ඔහුගේ බිරිඳගෙන් 2025 මැයි මස සිට අයකර ගැනීමටත්, විශ්‍රාමික නිලධාරියාගේ ණයශේෂය විශ්‍රාම වැටුපෙන් මාසිකව අයකර ගැනීමටත්, වැඩ තහනමකට ලක්වී ඇති නිලධාරියාගෙන් අයවිය යුතු ණයශේෂය පරීක්ෂණය අවසන් වූ පසු අයකර ගන්නා බවටත් දක්වා තිබුණි. සේවය හැරගිය නිලධාරින් 04දෙනෙකුගෙන් අයවිය ණය ශේෂ පිළිවෙලින් අනිවාර්යය විශ්‍රාම ගැන්වීම තුළින් විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමටත්, ඇපකරුගේ මාසික වැටුපෙන් අයකර ගැනීමටත්, ණය මුදල් ගෙවන ලෙස සිහිකැඳවීම් ලිපි යැවීමටත්, ණය පියවීමට කටයුතු කරන ලෙස හා එසේ කිරීමට අපොහොසත් වුවහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවටත් ලිපි මගින් දන්වා ඇති බවටත් දක්වා තිබුණි.	අදාළ ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වේ.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය 1,422ක් ද, තථ්‍ය කාර්යමණ්ඩලය 1,077ක් ද වූ අතර, සමාලෝචිත වර්ෂයේ කාර්යමණ්ඩලය පුරප්පාඩු 345ක් පැවතුණි. ඒ අනුව කාර්යමණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 2023 වර්ෂයට සාපේක්ෂව පුරප්පාඩු 130කින් වර්ධනය වී තිබුණි.	එකිනෙක තනතුරුවලට අදාළව පුරප්පාඩු පිරවීමට කටයුතු සිදුකරමින් පවතින බවත් දක්වා තිබුණි.	පවතින පුරප්පාඩු පිරවීමට පියවරගත යුතු වේ.
(ආ)	ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට ද්විතීක සේවා මට්ටමේ මෙහෙයුම් සහකාර තනතුර සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 100ක් පැවති අතර, ඉන් 50ක් බඳවාගැනීමට අනුමැතිය ලැබී තිබුණි.	මෙහෙයුම් සහකාර තනතුරු 100ක් 2024.12.31 දිනට පුරප්පාඩුව පැවතුණු බවත්, ඉන් 50ක් බඳවාගැනීමට අනුමැතිය ලැබී ඇති බවත්, ඒ සඳහා බඳවාගැනීමට 2024.07.27 දින විභාගයක් පවත්වා 2024.12.03 හා 04 දිනවල සම්මුඛ පරීක්ෂණ පවත්වා එයින් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ පොලිස් වාර්තා කැඳවා ඇති බවත්, එම වාර්තා ලද පසු පත්වීම් ලබාදීමට කටයුතු සූදානම් කර ඇති බවත් දක්වා තිබුණි.	පවතින පුරප්පාඩු පිරවීමට පියවරගත යුතු වේ.